Australian Government
Department of Home Affairs

# Privacy notice
# Visitors to immigration detention facilities
# පුද්ගලිකතා දැන්වීම
# සංක්‍රමණ රැඳවුම් පහසුකම් වෙත පැමිණෙන අමුත්තන්

Form
**1553 SIN**
SINHALESE

The Department of Home Affairs (ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව) (දෙපාර්තමේන්තුව) යන්නට Australian Border Force (ඕස්ට්‍රේලියානු දේශසීමා බලකාය) ඇතුලත්වේ. *Privacy Act 1988 (1988 පුද්ගලිකතා පනත)* අනුව දෙපාර්තමේන්තුව විසින් යම් අයෙකු සම්බන්ධයෙන් පුද්ගලික තොරතුරු රැස් කරන විට අදාල පුද්ගලයා හට දැනුම් දිය යුතු යම් කරුණු ඇත. මෙම ආකෘතිය ඔබ විසින් සංක්‍රමණ රැඳවුම් මධ්‍යස්ථාන වෙත පැමිණි විට එම කරුණු සම්බන්ධයෙන් ඔබ වෙත කරනු ලබන දැන්වීමයි.

## පුද්ගලිකතා පනත

The Department of Home Affairs (ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව) Australian Privacy Principles (ඕස්ට්‍රේලියානු පුද්ගලිකතා මූලධර්ම) (APPs) අනුව පුද්ගලිකතා පනතේ 1 වන උප ලේඛණය අනුව කටයුතු කිරීමට බැඳී සිටී. APPs මගින් අප විසින් පුද්ගලික තොරතුරු රැස් කිරීම, භාවිතා කිරීම, තැන්පත් කිරීම සහ හෙළිදරව් කිරීම, සහ ඔබ සම්බන්ධ අප සතු තොරතුරු වෙත ප්‍රවේශවීම හෝ නිවැරදි කර ගැනීම කර ගන්නා ආකාරය නියාමණය කරයි.

දෙපාර්තමේන්තුවේ ගිවිසුම්ගත සේවා සපයන්නන් විසින්ද පුද්ගලිකතා පනතට අනුව කටයුතු කිරීමට බැඳී සිටී.

පුද්ගලිකතා පනත මගින් පහත දේ රැස් කිරීමට අනුමැතිය ලබා දෙයි:

- සංවේදී තොරතුරු:
  - ඔබගේ කැමැත්ත ඇතිව (දෙපාර්තමේනතුවේ කටයුතු හෝ ක්‍රියාකාරකම් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් සඳහා තොරතුරු රැස් කිරීම සාධාරණ ලෙස අවශ්‍ය වන විට නැතිනම් කෙළින්ම සම්බන්ධ වන විට)
  - ‘අවසරය ඇති සාමාන්‍ය තත්වයකදී’ (ජීවිතයකට, පුද්ගලයෙකුගේ සෞඛ්‍යය හෝ ආරක්ෂාවට, හෝ මහජන සෞඛ්‍යය හෝ ආරක්ෂාවට දරුණු තර්ජනයක් අඩු කිරීමට හෝ වැළැක්වීමට, වැනිඅවස්ථාවල)
  - ඕස්ට්‍රේලියානු නීතියක් හෝ අධිකරණ/විනිශ්චය සභා නියෝගයක් මගින් අවශ්‍ය වන අවස්ථාවල හෝ බලය ලබාදී ඇති විට, හෝ
  - දෙපාර්තමේන්තුව මගින් හෝ එය වෙනුවෙන් බලාත්මක කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම්වලදී
- දෙපාර්තමේන්තුවේ කටයුතු හෝ ක්‍රියාකාරකම් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වන අවස්ථාවල හෝ කෙළින්ම සම්බන්ධ අවස්ථාවල වෙනත් පුද්ගලික තොරතුරු.

මෙම දැන්වීම මගින් අප විසින් (දෙපාර්තමේන්තුව) ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කිරීමට හේතුව සහ සංක්‍රමණ රැඳවුම් පහසුකමක් වෙත යාමේදී ඒවා අප විසින් කළමණාකරණය කරන ආකාරය පහදා දෙයි. අප විසින් පුද්ගලික තොරතුරු පරිහරණය කරන ආකාරය සම්බන්ධ වැඩිදුර තොරතුරු දෙපාර්තමේන්තුවේ පුද්ගලිකතා ප්‍රතිපත්තිය ඇති **https://www.homeaffairs.gov.au/access-and-accountability/our-commitments/privacy** වෙත ප්‍රවේශවීමෙන් ලබා ගත හැකිය.

පුද්ගලිකතා ප්‍රතිපත්තියේ පහත සඳහන් තොරතුරු ඇත:

- දෙපාර්තමේන්තුව සතුව ඇති ඔබගේ පුද්ගලික තොරතුරුවලට ප්‍රවේශ විය හැකි ආකාරය සහ ඒවා නිවැරදි කර ගන්නා ආකාරය
- ඔබගේ පුද්ගලිකතාවය උල්ලංඝණය වී ඇති අවස්ථාවක පැමිණිලි කරන ආකාරය සහ දෙපාර්තමේන්තුවේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරන පටිපාටීන්.

## අප විසින් ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කිරීමට හේතුව

පුද්ගලික තොරතුරු රැස් කිරීමේ මූලික අරමුණ වන්නේ *Migration Act 1958 (1958 සංක්‍රමණ පනත)* යටතේ ඇති සංක්‍රමණ රැඳවුම පරිපාලනය සම්බන්ධ දෙපාර්තමේන්තුවේ කටයුතු සහ ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමවේ. පුද්ගලිකතා පනත යටතේ ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කල අරමුණ වෙනුවෙන් ඒවා භාවිතා කිරීමට හෝ හෙළිදරව් කිරීමට අපට අවසර ඇත.

පුද්ගලිකතා පනත යටතේ ද්විතීයික අරමුණක් වෙනුවෙන්ද තොරතුරු භාවිතා කිරීම හෝ හෙළිදරව් කිරීම කල හැකිය. මෙය සිදු වන්නේ:

- ඔබගේ අනුමැතිය ඇතිව:
- දෙපාර්තමේන්තුව මගින් ඔබගේ පුද්ගලික තොරතුරු භාවිතා කිරීම හෝ හෙළිදරව් කිරීම කරන බවට ඔබ සාධාරණ ලෙස අපේක්ෂා කරන අතර ද්විතීයික අරමුණ කෙළින්ම ප්‍රාථමික අරමුණ හා සම්බන්ධවන (සංවේදී තොරතුරු සම්බන්ධයෙන්) හෝ ප්‍රාථමික අරමුණ හා සම්බන්ධවන (වෙනත් පුද්ගලික තොරතුරු සම්බන්ධයෙන්) අවස්ථාවල.
- තොරතුරු භාවිතා කිරීම හෝ හෙළිදරව් කිරීම ඕස්ට්‍රේලියානු නීතියක් හෝ අධිකරණ/විනිශ්චය සභා නියෝගයක් යටතේ අවශ්‍ය වන හෝ බලය ලබා දී ඇති අවස්ථාවල.
- ‘අවසර ඇති සාමාන්‍ය තත්වයකදී’ (පුද්ගලයෙකුගේ ජීවිතයට, සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට හෝ මහජන සෞඛ්‍යය හෝ ආරක්ෂාවට දරුණු තර්ජනයක් සිදුවීම අඩු කිරීමට හෝ මඟ හැරීමට වැනි අවස්ථාවල)
- නීතිය බලාත්මක කිරීමට අදාල අරමුණු සඳහා.

දෙපාර්තමේන්තුව මගින් එහි ගිවිසුම්ගත සේවා සපයන්නා(සපයන්නන්) මගින් පහත අවස්ථාවල ආරක්ෂාව, මනා පැවැත්ම හෝ සුරක්ෂිතබව පවත්වාගැනීම සඳහා ඔබගෙන් පුද්ගලික තොරතුරු ලබා ගනී:

- සංක්‍රමණ රැඳවුම් පහසුකමක
- සංක්‍රමණ රැඳවුම් ජාලය සහ/හෝ
- සංක්‍රමණ රැඳවුම් පහසුකමක කාර්ය මණ්ඩලය, රැඳවුම් කරුවන් සහ අමුත්තන්.

මේවා අතරට සෞඛ්‍යයට අදාල අවදානම් හඳුනා ගැනීම සහ කළමණාකරණය සහ බෝවන රෝග පැතිරීම සම්බන්ධ නිසි පාලනයන් ක්‍රියාත්මක කිරීම ඇතුලත්වේ.

මෙම තොරතුරු මගින් දෙපාර්තමේන්තුව හට *Work Health and Safety Act 2011* (Cth) (WHS Act) *(2011 රාජකාරී සෞඛ්‍යය සහ ආරක්ෂක පනතේ)* 2 වන කොටසේ ඇති ‘සෞඛ්‍යය සහ ආරක්ෂාව සම්බන්ධ වගකීම්’ යටතේ සිය සේවකයන් සහ අනෙක් පුද්ගලයන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂව රැක ගැනීම සම්බන්ධ වගකීම සපුරාලීමට උපකාරවේ.

## දෙපාර්තමේන්තුව මගින් ඔබගේ පුද්ගලික තොරතුරු රැස් නොකලහොත් ඇතිවිය හැකි ඵල විපාක

ඔබගේ පුද්ගලික තොරතුරු රැස් නොකලහොත්, සංක්‍රමණ රැඳවුම් මධ්‍යස්ථානයක්, හෝ සංක්‍රමණ රැඳවුමක සිටින පුද්ගලයෙකු බැලීම සම්බන්ධ ඔබගේ අයදුම් පත්‍රය සලකා බැලිය නොහැක.

© COMMONWEALTH OF AUSTRALIA, 2022

## අප ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කරන ආකාරය

ඔබගේ පුද්ගලික තොරතුරු සාමාන්‍යයෙන් රැස් කරනු ලබන්නේ දෙපාර්තමේන්තුව වෙනුවෙන් සංක්‍රමණ රැඳවුම් මධ්‍යස්ථානවල අමුත්තන්ගේ අයදුම්පත් සලකා බලන සහ/හෝ සෝදිසි කිරීම් කරන ගිවිසුම්ගත සේවා සපයන්නන් විසිනි. සාමාන්‍ය වශයෙන් ඔබගෙන් තොරතුරු කෙළින්ම රැස් කිරීම සිදුවේ.

ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කිරීම ස්වේච්ඡාවෙන් සිදු වුවද, ඔබගේ පුද්ගලික තොරතුරු රැස් නොකලහොත්, සංක්‍රමණ රැඳවුම් පහසුකමකට හෝ සංක්‍රමණ රැඳවුමේ සිටින පුද්ගලයෙකු බැලීමට ඉදිරිපත් කරන ඔබගේ අයදුම් පත්‍රය සලකා බැලිය නොහැක.

ඔබගේ පුද්ගලික තොරතුරු සංක්‍රමණ රැඳවුම් පහසුකමේ ඇති ලේඛණයක ඇතුලත් කර තබන අතර දෙපාර්තමේන්තුවේ කාර්යයන් සහ ක්‍රියාකාරකම් ඉටු කිරීමේ අරමුණු හෝ වෙනත් ආකාරයකට ඕස්ට්‍රේලියානු   නීතියකින් අවසරය ඇති අවස්ථාවල දෙපාර්තමේන්තුවේ වෙනත් ස්ථාන වෙත ලබා දිය හැකිය.

සංක්‍රමණ රැඳවුම් පහසුකම පුරා සංවෘත-පරිපථ රූපවාහිණී (CCTV) දිගටම භාවිතා වෙමින් පැවතිය හැකිය. CCTV මගින් නියාමණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔබගේ ඡායාරූපය සහ කථාව පටිගත විය හැකිය. CCTV නියාමණය මගින් ලබා ගන්නා ශ්‍රව්‍ය සහ දෘශ්‍ය පටිගත කිරීම් රහසිගත ආකාරයට සලකන අතර භාවිතා කිරීම හෝ හෙළිදරව් කිරීම සිදු කරන්නේ ඉහත අරමුණු වෙනුවෙන් හෝ වෙනත් ආකාරයකට ඕස්ට්‍රේලියානු නීතිය මගින් අවශ්‍යවන හෝ අවසරය ඇති අවස්ථාවල පමණි.

## ඔබගේ පුද්ගලික තොරතුරු අප විසින් හෙළිදරව් කරන අය

ඔබගේ තොරතුරු රහසිගත ආකාරයට සලකන අතර භාවිතා කිරීම හෝ හෙළිදරව් කිරීම සිදු කරන්නේ මෙම දැන්වීමේ දක්වා ඇති අරමුණු සඳහා හෝ පුද්ගලිකතා පනත මගින් හෝ වෙනත් ඕස්ට්‍රේලියානු  නීතියක් මගින් අවශ්‍ය වන හෝ බලය ලබාදී ඇති වෙනත් අවස්ථාවල පමණි.

ඕස්ට්‍රේලියානු නීතියක් යනු කොමන්වෙල්ත්, ප්‍රාන්ත හෝ ටෙරිටරි නීතියක්වේ.

දෙපාර්තමේන්තුව මගින් ඔබගේ පුද්ගලික තොරතුරු, ඔබ විසින් ඉදිරිපත් කරන අමුත්තන්ගේ අයදුම් පත්‍රය සලකා බැලීම, අපරාධ වරදක් සම්බන්ධයෙන් වැළැක්වීම, රඳවා ගැනීම, පරීක්ෂණ පැවැත්වීම සහ නඩු පැවරීම හෝ දඬුවම් ලබාදීම ආදී අරමුණු වෙනුවෙන් ඕස්ට්‍රේලියානු ෆෙඩරල් පොලීසිය සහ/හෝ ප්‍රාන්ත හෝ ටෙරිටරි පොලිස් බලකායක් හෝ සේවාවක්, වැනි ඕස්ට්‍රේලියානු නීතිය බලාත්මක කරන ඒජන්සි හෝ ආයතන (කොමන්වෙල්ත්, ප්‍රාන්ත සහ ටෙරිටරි) හට හෙළිදරව් කල හැකිය.

ඔබ විසින් කොමන්වෙල්ත් රජයට, ප්‍රාන්ත රජයට හෝ ටෙරිටරි රජයට ලබා දෙන තොරතුරු සෞඛ්‍යය සහ ජීව ආරක්ෂාව සම්බන්ධ නීති බලාත්මක කිරීම සඳහා හෙළිදරව් කල හැකිය.

## පුද්ගලික තොරතුරු විදේශවලට හෙළිදරව් කිරීම

ඔබගේ පුද්ගලික තොරතුරු ඔබගේ අනුමැතිය ඇතිව හෝ පුද්ගලිකතා පනතේ 1 වන උපලේඛණයේ APP 6 සහ APP 8 යටතේ අවසරය ලබා දෙන්නේ නම් මිස විදේශයකට හෙළිදරව් කරන්නේ නැත.

## ඔබගේ පුද්ගලික තොරතුරු වෙත ප්‍රවේශවීම හෝ ඒවා නිවැරදි කරවා ගන්නා ආකාරය

*Freedom of Information Act 1982* (Cth) *(1982 නිදහසේ තොරතුරු ලබා ගැනීමේ පනත)* සහ පුද්ගලිකතා පනත යටතේ ඔබගේ තොරතුරු ලබා ගැනීමට හෝ නිවැරදි කරවා ගැනීමට ඉල්ලීමක් කල හැකිය. අපගේ පුද්ගලිකතා ප්‍රතිපත්තිය මගින්ඔබ සම්බන්ධයෙන් අප වෙත ඇති පුද්ගලික තොරතුරු ලබා ගත හැකි ආකාරය හෝ තොරතුරු නිවැරදි කර ගත හැකි ආකාරය සම්බන්ධයෙන් පැහැදිලි කරයි.

## ගැටළු සහ පැමිණිලි

පුද්ගලිකතා පනතට අනුකූලව ඔබගේ පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීමට දෙපාර්තමේන්තුව ඇප කැපවී සිටියි. දෙපාර්තමේන්තුව මගින් ඔබගේ පුද්ගලික තොරතුරු අපගේ APPs හි ඇති වගකීම් උල්ලංඝණය වන ආකාරයට පරිහරණය කර ඇති බවට ඔබ විශ්වාස කරයි නම්, ඔබ විසින් පැමිණිල්ලක් කල හැකි ආකාරය සහ ඔබගේ පැමිණිල්ල සම්බන්ධයෙන් අප විසින් කටයුතු කරන ආකාරය අපගේ පුද්ගලිකතා ප්‍රතිපත්තිය මගින් පැහැදිලි කර දෙයි.

## අප සමඟ සම්බන්ධ විය හැකි ආකාරය

සම්පූර්ණ සම්බන්ධවීමේ තොරතුරු දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ලබාගත හැකිය: **www.homeaffairs.gov.au**

එසේ නැතිනම්, ඔබගේ අදහස් පහත අකාරයට අප වෙත ලබා දිය හැකිය:

- මාර්ගස්ථ අදහස් ලබා දීමේ පෝරමය
- ලියා දන්වන්න:
  The Manager Global Feedback Unit
  GPO Box 241
  Melbourne VIC 3001 Australia


© COMMONWEALTH OF AUSTRALIA, 2022